අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் நாயகம்
Director General
+94-081-2388195

E-mail : dgdaph@sltnet.lk


# සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

# கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களம்

# Department of Animal Production and Health


කාර්යාලය
அலுவலகம்
Office
+94-081-2388120
184/189/337/462

Web : www.daph.gov.lk


මගේ අංකය : DAPH/AD/20/3/5

දිනය: 2024.11. 06

1. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය
2. ලේකම් (බස්නාහිර/ මධ්‍යම/ දකුණ /උතුර/නැගෙනහිර/වයඹ/උතුරු මැද/ඌව/සබරගමුව) පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින්

   ප්‍රධාන ලේකම් (බස්නාහිර/මධ්‍යම/ දකුණ /උතුර/නැගෙනහිර/වයඹ/උතුරු මැද/ ඌව/සබරගමුව) පළාත මගින්

   ලේකම් (බස්නාහිර/ මධ්‍යම/ දකුණ/උතුර/නැගෙනහිර/වයඹ/උතුරු මැද/ඌව/සබරගමුව) පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශය මගින්

   පළාත් අධ්‍යක්ෂ (බස්නාහිර/ මධ්‍යම/දකුණ/ උතුර/නැගෙනහිර/වයඹ/උතුරු මැද/ඌව/සබරගමුව) පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
3. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
4. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
5. නාගරික කොමසාරිස්, (කොළඹ/ මහනුවර/ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ/ දෙහිවල- ගල්කිස්ස/ මොරටුව/ මීගමුව/ කඩුවෙල/ ගම්පහ/ යාපනය/ අනුරාධපුර/ අක්කරෙයිපත්තුව) මහ නගර සභාව
6. අධ්‍යක්ෂ (සත්ත්ව සෞඛ්‍ය/ සත්ත්ව අභිජනන/ පශු පර්යේෂණ/ මානව සම්පත් සංවර්ධන/ සැලසුම් හා ආර්ථික/ පශු අණපනත් හා නීති ) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**<u>ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ වාර්ෂික ස්ථාන මාරු - 2025</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ අමතන ලද මගේ සමාංක හා 2024.07.05 දිනැති ලිපිය හා බැදේ.

02. ඒ අනුව ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද ස්ථාන මාරු අයදුම්පත්, 2024.10.08 දින රැස් වූ ස්ථාන මාරු මණ්ඩලය විසින් සලකා බලන ලද අතර, එම මණ්ඩලය ඉදිරිපත් කළ ස්ථාන මාරු නිර්දේශයන් කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශ ලේකම්ගේ අංක: Livestock/2/13/05 (vol-v) හා 2024.10.30 දිනැති ලිපිය මගින් අනුමත කර ඇත.

03. ඒ අනුව මේ සමඟ ඇති ඇමුණුම - 01 හි සඳහන් ඔබ පළාතට / ආයතනයට / අංශයට අනුයුක්ත නිලධාරින්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් අදාළ නිලධාරින් දැනුවත් කර, ඔවුන් හට අදාළ සේවා ස්ථාන වෙත සේවයට වාර්තා කිරීමට හැකිවන සේ ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වීමට නියමිත 2025.01.01 දින සිට නිදහස් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

04. ඇමුණුම - 01 හි සඳහන් තීරණ පිළිබඳ නිලධාරින්ගේ අභියාචනා වෙතොත් එම අභියාචනා ආකෘති අංක IV අනුව සකස් කර, පළාත් බලධාරින්ගේ/ ආයතන ප්‍රධානීන්ගේ/ අංශ භාර අධ්‍යක්ෂකගේ නිර්දේශ ද සහිතව මෙම ලිපියේ සඳහන් දින සිට දින 14 ක් ඇතුළත එවීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

05. අදාල අංක IV දරණ ආකෘතිය ස්ථාන මාරුවීම් සඳහා අයදුම් පත් කැඳවන ලද මගේ අංක DAPH/AD/20/3/5 හා 2024.07.05 දිනැති ලිපියේ 05 ඡේදයෙන් දන්වා ඇති පරිදි දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය වන www.daph.gov.lk මඟින් බා ගත කළහැකි බව වැඩිදුරටත් දන්වමි.

06. එසේම අභියාචනා තීරණ දැන්වීමෙන් අනතුරුව එකී තීරණ සම්බන්ධයෙන් අතෘප්තියට පත්වන නිලධාරින්ට රාජ්‍ය සේවා කොමිෂන් සභා රෙගුලාසි 231 පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා (ආකෘති අංක V අනුව සකස් කර) කළහැකි බවද දන්වන්නේ නම් මැනවි.

07. මෙම ලිපියේ සඳහන් දින සිට දින 14 ක් ඇතුළත නොලැබෙන අභියාචනා සලකා නොබලන බවද, යම් හෙයකින් අභියාචනා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙත නිසි බලධාරින් මඟින් ඉදිරිපත් කිරීමේදී ප්‍රමාද වන්නේ නම් පළාත් සභාවලට අනුයුක්ත නිලධාරින්ගේ අභියාචනාවල ප්‍රගමන පිටපත් එවීම වැදගත් වන බවටද නිලධාරීන් දැනුවත් කරන්නේ නම් මැනවි.

ආචාර්ය කේ. ඒ. සී. එච්. ඒ. කොතලාවල
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

01. ලේකම්, කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය - ඔබේ අංක Livestock/2/13/05 (vol-v) හා 2024.10.30 දිනැති ලිපිය අනුව කා.දැ.ගැ.ස.

02. පළාත් අධ්‍යක්ෂ, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (බස්නාහිර/මධ්‍යම/දකුණ/සබරගමුව/ ඌව/උතුරු මැද/උතුර/නැගෙනහිර/වයඹ) - කරු. අ. ක. ස.